දිවයින පුවත්පතේ (07/07) කොලමක "පියසිරි අයියගේ පොරොන්දම් ගැලපිල්ල" යන සිරස්තලය යටතේ ලිංගික අපරාධ සිදුවීමක් දැක්වී තිබිණි. එම කොලමේ අන්තර්ගතය පිළිබඳව අපගේ නිරීක්ෂණයන් මෙසේ පෙළ ගස්වමු.

1) මෙහි සිරස්තලය ඔස්සේත්, අන්තර්ගතයේ ඇතැම් කොටස් ඔස්සේත් බාලවයස් ලිංගික අපරාධයක් ඉදිරිපත් කර තිබුණේ, එහි බරපතළ බව සැහැල්ලු කරමිනි. බාලවයස්කරුවෙකු ගේ කැමැත්තෙන් ලිංගික සබඳතාවයක් සිදු වුවත්, එය නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය යුතු වරදක් ලෙසින් දැක්වේ.

2) මෙම සිදුවීම සම්බන්ධයෙන් අදාළ බාලවයස්කාර දැරිය වෙත දෝෂාරෝපණය එල්ල වී තිබිණි.

3) වින්දිත බාලවයස්කාර දැරියගේ බාහිර පෙනුම ආදිය විස්තර කරමින්, භාවාතිශය ආකාරයකින් මෙම පුවත ඉදිරිපත් කර තිබිණි.

මෙම කරුණු කාරණා සලකා බලන විට, දිවයින පුවත්පතේ මෙම කොළම මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැනි ව ලියැවුණක් ලෙසින් ගැනීමට සිදු නොවේද? මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina